## 2015 ජූලි සිට 2015 නොවැම්බර් දක්වා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පළමුවැනි වාර්තාව

**සභාව පිහිටුවීම:**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 19 වැනි සංශෝධනය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවන ලදී. ගරු කථානායකතුමා විසින් 2015 මැයි මස 15 වන දින 19 වන සංශෝධනය සඳහා සහතිකය සටහන් කරනු ලැබූ අතර එය එදිනම ගැසට් පත්‍රයේ පළකරන ලදී.

**සභාවේ සංයුතිය:**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ.(1) ව්‍යවස්ථාවේ සඳහන් වන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගේන් සමන්විත විය යුතුය;

(අ) අග්‍රාමාත්‍යවරයා,

(ආ) කථානායකවරයා,

(ඇ) පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා,

(ඈ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්,

(ඉ) අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාගේම නාමයෝජනා කිරීම මත ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබිය යුතු වූද, දෙදෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විය යුතු වූ ද, තැනැත්තන් පස් දෙනෙක් සහ

(ඊ) අග්‍රාමාත්‍යවරයා හා විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ නොවන පාර්ලිමේන්තුවේ නියෝජනය ඇති අනෙකුත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාම යෝජනා කොට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්

**සභාවේ සභාපතිවරයා:**

41අ. (2) ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයා සභාවේ සභාපතිවරයා වන්නේය.

**සභාවට කරන පත් කිරීම්:**

41අ. (1) (ඈ) ප්‍රකාරව සභාවේ එක් සාමාජිකයෙක් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතුය. 41අ. (1) (ඈ) යටතේ අතිගරු ජනාධිපතිතුමා එතුමාගේ 2015 සැප්තැම්බර් 07 දිනැති ලිපිය මගින් කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කළ බව ගරු කථානායකතුමාට දැන්වීය.

41අ (4) ව්‍යවස්ථාවේ මෙසේ දක්වා තිබේ:- "මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ සඳහන් තැනැත්තන් පස් දෙනා නම් කිරීමේ දී අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් වෘත්තීය සහ සාමාජීය විවිධත්වය ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ත්ව ලක්ෂණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් පිළිබිඹුවන බව සහතික වීම පිණිස, පාර්ලිමේන්තුවේ නියෝජනය වන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයන් විමසිය යුත්තේය." අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා සහ විරුද්ධ පක්ෂයේ නායක ගරු. ආර් සම්පන්දන් මහතා යන දෙදෙනා අත්සන් කොට ගරු කථානායකතුමාට යවන ලද ලිපියකින් පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්

දෙදෙනා 41අ. (1) (ඉ) යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කරන ලද බව දැන්වූ අතර, ගරු කථානායකතුමා එම කරුණ 2015 සැප්තැම්බර් 21 දින ජනාධිපතිවරයා වෙත දන්වන ලදී. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා, පහත සඳහන් එම මන්ත්‍රීවරුන් දෙදෙනා ව්‍යවස්ථාදායක සභාවට පත්කරන ලදී.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා, අධිකරණ සහ බුද්ධ ශාසන අමාත්‍ය

ගරු විජිත හේරත් මහතා

අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා සහ විරුද්ධ පක්ෂයේ නායක ගරු ආර්. සම්පන්දන් මහතා යන දෙදෙනා අත්සන් කොට ගරු කථානායකතුමාට යවන ලද ලිපියකින් පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන තැනැත්තන් තිදෙනා 41අ (1) (ඉ) යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත්කරන ලද බවත්, මෙම පුද්ගලයන් දෙදෙනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (5) ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත් බවත් දන්වා ඇත. ගරු කථානායකතුමා විසින් පාර්ලිමේන්තුවේ අනුමැතිය 2015 සැප්තැම්බර් 22 දින අතිගරු ජනාධිපතිතුමාට දන්වන ලදි. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන තැනැත්තන් තිදෙනා ව්‍යවස්ථාදායක සභාවට පත්කරන ලදී.

ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතා

ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසීස් මහතා

ආචාර්ය රාධිකා කුමාරස්වාමි මිය

41 අ. (1) (ඊ) ව්‍යවස්ථාව අනුව අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ නොවන පාර්ලිමේන්තුවේ නියෝජනය ඇති අනෙකුත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම් වල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාමයෝජනා කරන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කළ යුතුය. ඒ අනුව කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා මෙම සභාවට පත් කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් නොවන පාර්ලිමේන්තුවේ පිළිගත් අනෙකුත් දේශපාලන පක්ෂවල නායකයන් විසින් අත්සන් කරන ලද ලිපියක් මගින් නම් කරනු ලැබූ අතර, එය ගරු කථානායකතුමා විසින් 2015 සැප්තැම්බර් 22 දින අතිගරු ජනාධිපතිතුමා වෙත දන්වන ලදී. ඒ අනුව ගරු ජෝන් සෙනෙවිරත්න මහතා අතිගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කරන ලදී .

**සභාවේ සාමාජිකයින්:**

ගරු කරු ජයසූරිය මහතා (කථානායක) - සභාපති

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍ය)

ගරු ආර්. සම්පන්දන් මහතා (විපක්ෂ නායක)

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා

ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහතා

ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසීස් මහතා

ආචාර්ය රාධිකා කුමාරස්වාමි මහත්මිය

**සභාවේ රැස්වීම්:**

41 ඉ. (1) වගන්තිය ප්‍රකාරව සභාව වෙත පවරා දී ඇති කාර්යයන් ඉටු කිරීම පිණිස සභාව යටත් පිරිසෙයින් සෑම මසකටම දෙවතාවක් සහ අවශ්‍යතාවය පරිදි ඊට වැඩි වාර ගණනක් රැස් විය යුතුය. ඒ අනුව මෙම සභාව 2015 ජූලි 03, 2015 ජූලි 09, 2015 සැප්තැම්බර් 10, 2015 සැප්තැම්බර් 21, 2015 සැප්තැම්බර් 23, 2015 ඔක්තෝබර් 09, 2015 ඔක්තෝබර් 14, 2015 ඔක්තෝබර් 22, 2015 නොවැම්බර් 04, 2015 නොවැම්බර් 06, 2015 නොවැම්බර් 09, 2015 නොවැම්බර් 19, 2015 නොවැම්බර් 23 සහ 2015 නොවැම්බර් 24 යන දිනවල රැස් විය.

**සභාව විසින් ගනු ලැබූ තීරණ:**

1. කොමිෂන් සභා සඳහා පත් කිරීම් සිදු කිරීමේදී කොමිෂන් සභා නියෝජනය කිරීමට නීතිඥයන්ට අමතර වශයෙන් ඉංජිනේරුවන් සහ ගෘහ නිර්මාණ ශිල්පීන් ආදී පුළුල් පරාසයක ක්ෂේත්‍ර නියෝජනය කරන වෘත්තිකයන් හට අවස්ථාව ලබා දීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් 2015 ජූලි 09 වන දින පැවති සිය රැස්වීමේදී තීරණය කරන ලදී.

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාව හැකිතාක් ඉක්මනින් පිහිටුවීමේ අවශ්‍යතාවය 2015 සැප්තැම්බර් 10 වන දින රැස් වූ සභාව අවධාරණය කළ අතර, ඒ අනුව 2015 සැප්තැම්බර් 20 වන දිනට පෙර එම කොමිෂන් සභා සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමට පිළිගත් දේශපාලන පක්ෂ නායකයින් සහ වෘත්තිය සහ සිවිල් සමාජ සංවිධාන වෙත අවස්ථාව ලබා දීමට තීරණය කරන ලදී.

3. කොමිෂන් සභා සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවටත් ලබා දීමට 2015 සැප්තැම්බර් 21 වන දින රැස් වූ සභාව විසින් තීරණය කරන ලදී. එසේම කොමිෂන් සභා සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වන කාලය 2015 සැප්තැම්බර් 30 වන දින දක්වා දීර්ඝ කිරීමටත් තීරණය කරන ලදී.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩ බලන මහ ලේකම්වරයා ලෙස ධම්මික දසනායක මහතා පත් කිරීමටත් සභාව තීරණය කරන ලදී.

**නාම යෝජනා කැඳවීමේ ක්‍රමවේදය:**

නාම යෝජනා පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කොට 2015 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි එවීමට උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව පහත සඳහන් පරිදි පුද්ගලයින්ගෙන් සහ සංවිධානවලින් ලත් නාම යෝජනා සංඛ්‍යාව 482කි.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් - 191

(ආ) පිළිගත් දේශපාලන පක්ෂ නායකයින් - 09

(ඇ) වෘත්තිය ආයතන සංවිධානය - 160

(ඈ) විශ්වවිද්‍යාල ආචාර්ය සම්මේලනය - 09

(ඉ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කාන්තා සම්මේලනය - 05

(ඊ) වෙනත් සංවිධාන සහ පුද්ගලයින් - 108

**5.** කොමිෂන් සභා සඳහා පත් කළ යුතු සභාපතිවරුන් සහ සාමාජිකයින් තේරීමේ මූලික ඇගයීම් කටයුතු සිදු කිරීමේ කාර්යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ සිවිල් සමාජ නියෝජනය කරන සාමාජිකයින්ගෙන් සැදුම්ලත් අනු කාරක සභාවක් වෙත පැවරීමට 2015 සැප්තැම්බර් 23 වන දින රැස් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් විසින් තීරණය කරන ලදී.

**කොමිෂන් සභාවන්හි සභාපතිවරුන් සහ සාමාජිකයින් තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය:**

සභාපතිවරුන් සහ සාමාජිකයන් තේරීමේදී ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන ඇගයීම් දෙකම සිදු කිරීමට තීරණය කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ/හෝ අදාළ නීති යටතේ කොමිෂන් සභා සාමාජික තනතුරු සඳහා වන අයදුම්පත්වල ගුණාත්මක විශ්ලේෂණය අනු කාරක සභාව විසින් හා අනතුරුව සමස්ත සභාව විසින් සිදු කරන ලදී.

**ගුණාත්මක විශ්ලේෂණයේදී භාවිතා කරන ලද නිර්ණායක**

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් එකඟ වූ කාර්ය පටිපාටියට අනුව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ලැබුණු අයදුම්පත්‍රවලට පමණක් තෝරා ගැනීම් සීමා කරන ලදී. පුද්ගලයින් නම් කිරීම බලයලත් කණ්ඩායම් හෝ පුද්ගලයින් විසින් සිදු කළ යුතුව තිබුණි.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ නියමිත නීතියේ විග්‍රහ කොට ඇති පරිදි එක් එක් කොමිෂන් සභාවේ අවශ්‍යතා මත තේරීම පදනම්ව විය.

(3) වඩාත්ම වැදගත් නිර්ණායක වූයේ අවංකත්වය, ස්වාධීනත්වය සහ අපක්ෂපාතීත්වයයි.

(4) දෙවන වැදගත්ම නිර්ණායකය වූයේ කොමිෂන් සභාවේ කටයුතු සඳහා අදාළ වන වෘත්තීයමය පළපුරුද්දයි. බොහෝ විද්වතුන් අයදුම්කළ තිබුණද ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට අදාළ කොමිෂන් සභාවේ කටයුතු සඳහා අවශ්‍ය සුදුසුකම් හෝ පළපුරුද්ද නොතිබුණි.

(5) තෙවැනි නිර්ණායකය වනුයේ, වැදගත් ආයතනවල හා තනතුරු වල කැපී පෙනෙන ගුණාංග සහ නායකත්වය පෙන්නුම් කර ඇත්තා වූ තම ක්ෂෙත්‍රයෙහි කැපී පෙනෙන පිරිස් පිළිබඳව සොයා බැලීමයි.

(6) අත්දැකීම් අත්‍යවශ්‍ය වූ බැවින් පරිණතභාවය ද සාධකයක් සේ සලකනු ලැබූ නමුත් කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා නව අදහස් එක් කළ හැකි තරුණ අපේක්ෂකයන් ද ඇතුළත් කරන ලදී.

(7) සැලකිල්ලට ගනු ලැබූ තවත් සාධකයක් වූයේ විවිධත්වයයි. සාමාජිකත්වයේ නිසි සමතුලිතබවක් පවත්වා ගැනීම පිණිස විශේෂයෙන්ම වාර්ගිකත්වය සහ ස්ත්‍රීපුරුෂ බව අනුව වූ විවිධත්වය කෙරෙහි ද සැලකිල්ල යොමු කරන ලදී.

(8) ඇතැම් අවස්ථාවන්හි, "බොහෝ ගෞරවාදරයට පාත්‍ර වූ" යන යෙදුම භාවිතා කරන ලදී - සිවිල් සමාජයේ අපේක්ෂකයන් ලෙස කෙටි ලැයිස්තු ගත කළ සාමාජිකයන් තිදෙනා ඉතා වෙනස් කණ්ඩායම්වලට හා විෂය ක්ෂෙත්‍රයන්ට අයත් විය. තෝරාගත් සියලු පුද්ගලයන් එම කණ්ඩායම්වල හා පොදුවේ මහජනතාවගේ විශ්වාසය දිනා ගනු ඇතැයි අනුකම්පුවට හැඟී ගිය අයවලුන් විය.

(9) අතීතයේදී කොමිෂන් සභා පිළිබඳ විශාල ලෙස මහජන විවේචන පැවැති බැවින්, මෑත වර්ෂවලදී කවර හෝ කොමිෂන් සභාවක කටයුතු නොකළ නවක අපේක්ෂකයන් ඇතුළත් කිරීමට උත්සාහ දරන ලදී.

(10) ලේකම් කාර්යාලය විසින් ප්‍රමාණාත්මක ඇගයීමක් ද සිදුකරනු ලැබූ අතර, එහිද අනාවරණය වූයේ ඉහළම ලකුණු ලබාගත් පිරිස බොහෝ අධ්‍යාපනික සුදුසුකම් හා විවිධ වෘත්තීයවේදී සංවිධානයන්හි සහභාගිත්වය ඇති අය බවයි. කොමිෂන් සභාව විසින් සත්‍ය ලෙසම ආවරණය කරනු ලබන ක්ෂෙත්‍රයන්හි පුළුල් අත්දැකීම් සහිත අය මෙන්ම තරුණ අයදුම්කරුවන් ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා ලදි. මෙම කරුණ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කළ යුත්තේ කෙසේදැයි සභාව විසින් තීරණය කරන ලදී.

(11) සියලු තීරණ ඒකමතික හා සම්මුතිය මත පදනම් වූ ඒවා විය.

**6.** කොමිෂන් සභාවන්හි ප්‍රමාණවත් කාන්තා නියෝජනයක් සහතික කළ යුතු බවට ද ආචාර්ය රාධිකා කුමාරස්වාමි මහත්මිය යෝජනා කළාය.

**7.** කොමිෂන් සභාවල සාමාජිකයන්ට ගෙවනු ලබන දීමනා සලකා බලන ලදුව, ඉහත කී දීමනා ප්‍රතිශෝධනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළ සභාව විසින් මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සමග සාකච්ඡා කොට ඉහත කී දීමනාවන්ට ප්‍රතිශෝධන නිර්දේශ කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, මුදල් අමාත්‍යාංශයේ ලේකම් සමග පැවැති සාකච්ඡාවෙන් අනතුරුව, කොමිෂන් සභාවක පූර්ණ කාලින සභාපතිවරයකුට රු. 150,000 ක දීමනාවක් සහ නිල වාහනයක්, කොමිෂන් සභාවක සභාපතිවරයකුට වෙන් කරන ලද නිල වාහනයට අදාළව පෙට්‍රල් හෝ ඩීසල් ලීටර 225 ක වත්මන් වෙළඳ පොළ මිලට අනුරූපී මාසික දීමනාවක්, කොමිෂන් සභාවක සභාපතිවරයා නොවන සාමාජිකයකුට රු. 100,000 ක දීමනාවක් සහ කොමිෂන් සභාවක සභාපතිවරයා නොවන සාමාජිකයකුට රු. 25,000 ක ප්‍රවාහන දීමනාවක් සහ කොමිෂන් සභාවල සභාපතිවරුන්ට සහ සාමාජිකයන්ට රු. 5,000 ක දුරකථන හා අන්තර්ජාල දීමනාවක් නිර්දේශ කිරීමට සභාව විසින් තීරණය කරන ලදී.

**8.** ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසීස් මහතා විසින් කරනු ලැබූ යෝජනාවක් අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ධුරයන් සඳහා ජනාධිපතිවරයා විසින් නිර්දේශ කරනු ලැබූ පත්වීම් අනුමත කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනය යටතේ ස්ථාපිත කරනු ලැබූ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සභාව විසින් අනුගමනය කරනු ලැබූ නිර්ණායකම අනුගමනය කිරීමට ද සභාව විසින් තීරණය කළ අතර සභාවේ තීරණය අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කිරීමට 2015 නොවැම්බර් 09 වන දින පැවැති සභාවේ රැස්වීමේදී තීරණය කරන ලදී. ඒ අනුව, සභාවේ තීරණය ජනාධිපතිතුමාගේ ලේකම්වරයා වෙත දන්වා යවන ලදී.

**නිර්ණායක පහත පරිදි වේ:**

***(අ) අග්‍රවිනිශ්චයකාරවරයා :***

i. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක් වීම ( සාමාන්‍යයෙන් වඩාත්ම ජ්‍යෙෂ්ඨ)

ii. නීතිපතිවරයා

iii. (අ) නීතිඥවරයෙක් වශයෙන් අවුරුදු 30ක අවම සේවා පළපුරුද්දක් ඇති; සහ

(ආ) සාර්ථක වෘත්තීය සේවාවක් ඇති; සහ

(ඇ) විනිශ්චයකාරවරුන් හා නීති වෘත්තිය තුළ උසස් පිළිගැනීමක් ඇති නීතිඥවරයෙක් වීම

ඉහත (ii) හෝ (iii) කාණ්ඩයන්හි තැනැත්තන් වයස අවුරුදු 62 නොඉක්මවූ අය විය යුතුය.

***(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් :***

නීතිඥවරයෙක් වශයෙන් අවුරුදු 25ක අවම සේවා පළපුරුද්දක් ඇති විශිෂ්ට හැකියාවෙන් යුත් පුද්ගලයෙකු වීම සහ;

i. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු වීම (සාමාන්‍යයෙන් ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව),

ii. විනිශ්චයකාරවරුන් අතර හා නීති වෘත්තිය තුළ උසස් පිළිගැනීමක් ඇති සාර්ථක සේවයක් ඇති නිතිඥවරයෙකු වීම,

iii. අවම වශයෙන් සොලිසිටර් ජෙනරාල් තනතුරවත් උසුලා ඇති රජයේ නිතිඥවරයෙකු වීම,

iv. (අ) අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වීම,

(ආ) නීති කෙටුම්පත් සම්පාදකවරයා වීම,

(ඇ) නීති විශාරදයෙකු හෝ නීති ක්ෂේත්‍රයේ ඉතා උසස් අධ්‍යාපනික සුදුසුකම් ලත් පුද්ගලයෙකු වීම

(අ), (ආ) සහ (ඇ) ට අදාලව එම තැනැත්තා

(i) නීතියෙහි සංවර්ධනය සහ ප්‍රගමනය වෙනුවෙන් සැලකිය යුතු දායකත්වයක් දක්වා තිබීම ; සහ

(ii) විනිශ්චයකාරවරුන්ගේ සහ නීති වෘත්තිකයන්ගේ උසස් පිළිගැනීමට පාත්‍ර වූ අයෙකු විය යුතුය.

ii, iii සහ iv කාණ්ඩවල තැනැත්තෙකු වයස අවුරුදු 62 නොඉක්මවූ අයෙකු විය යුතුය.

***(ඇ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා:***

(i) අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු වීම, (සාමාන්‍යයෙන් ජ්‍යෙෂ්ටතම විනිශ්චයකාරවරයා)

(ii) අ.) නීතිඥවරයෙකු ලෙස අවම වශයෙන් අවුරුදු 25 ක සේවා පළපුරුද්දක් තිබීම,

ආ.) සාර්ථක වෘත්තීය සේවාවක් ඇති අයෙකු වීම,

ඇ.) විනිශ්චයකාරවරුන් හා නීති වෘත්තිය තුළ උසස් පිළිගැනීමක් ඇති නීතිඥවරයෙකු වීම,

(iii) අ.) නීතිඥවරයෙකු ලෙස අවම වශයෙන් අවුරුදු 25 ක සේවා පළපුරුද්ද තිබීම,

ආ.) අවම වශයෙන් සොලිසිටර් ජෙනරාල් ස්ථිර තනතුරක් හොබවා තිබිය යුතුය,

ඇ.) විනිශ්චයකාරවරුන්ගේ සහ නීති වෘත්තිකයන්ගේ උසස් පිළිගැනීමට පාත්‍ර වූ රජයේ නිතිඥවරයෙකු වීම

(ii) සහ (iii) කාණ්ඩවලට අයත් තැනැත්තන් වයස අවුරුදු 60 නොඉක්මවූ අය විය යුතුය.

***(ඇ) අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්:***

නීතිඥවරයෙකු ලෙස අවම වශයෙන් වසර 20 ක සේවා පළපුරුද්ද සහිත විශිෂ්ට හැකියාවෙන් යුත් තැනැත්තෙකු වීම; සහ

1. මහාධිකරණ විනිශ්චයකාරවරයෙකු වීම (සාමාන්‍යයෙන් ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළින්),
2. විනිශ්චයකාරවරුන් අතර හා නීති වෘත්තිය තුළ උසස් පිළිගැනීමක් ඇති සාර්ථක සේවයක් ඇති නීතිඥවරයෙකු වීම,
3. අවම වශයෙන් නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් තනතුරක් ස්ථිර වශයෙන් හොබවා ඇති රජයේ නීතිඥවරයෙකු වීම,
4. (අ) අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වීම

   (ආ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වීම

   (ඇ) නීති කෙටුම්පත් සම්පාදකවරයා වීම

   (ඈ) නීති ක්ෂේත්‍රය තුළ ඉහළ අධ්‍යාපනික ජයග්‍රහණ අත්පත් කරගත් නීතිවේදියෙකු වීම

(අ), (ආ), (ඇ) සහ (ඈ) වැනි තැනැත්තෙකු වන්නේ නම්,

(i) නීතියෙහි සංවර්ධනය සහ ප්‍රගමනය වෙනුවෙන් සැලකිය යුතු දායකත්වයක් දක්වා තිබීම සහ

(ii) විනිශ්චයකාරවරුන්ගේ සහ නීති වෘත්තිකයන්ගේ උසස් පිළිගැනීමට පාත්‍ර වූ අයෙකු වීම.

2, 3 සහ 4 කාණ්ඩවලට අයත් නම් වයස අවුරුදු 60 නොඉක්මවූ තැනැත්තෙකු විය යුතුය.

***(ඉ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්:***

ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරුන් දෙදෙනා අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබීම අනුමත කෙරේ. කෙසේ වෙතත්, සභාපති වරයා සහ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයා යන දෙදෙනාම වෘත්තීය නීති නිලධාරීන් නොවන අවස්ථාවක, වෘත්තීය විනිශ්චයකාරවරයෙකුගේ සේවය ලබා ගැනීමේ හැකියාව තිබෙන අවස්ථාවක, ජ්‍යෙෂ්ඨතම වෘත්තීය විනිශ්චයකාරවරයා අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීම අනුමත කෙරේ.

*(ඊ) නීතිපතිවරයා:*

(i) ශ්‍රේෂ්ඨාධිකරණයෙහි විනිශ්චයකාරවරයෙකු,

(ii) සොලිසිටර් ජෙනරාල්වරයා

(iii) අතිරේක සොලිසිටර් ජෙනරාල් තනතුර ස්ථිර වශයෙන් හොබවා ඇති තැනැත්තෙකු (සාමාන්‍යයෙන් ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලින්)

(iv) (අ) නීතිඥවරයෙක් වශයෙන් අවුරුදු 30ක අවම සේවා පළපුරුද්දක් ඇති,

(ආ) සාර්ථක වෘත්තීය සේවාවක් ඇති අයෙකු වීම; සහ

(ඇ) විනිශ්චයකාරවරුන්ගේ සහ නීති වෘත්තිකයන්ගේ උසස් පිළිගැනීමට පාත්‍ර වූ නීතිඥවරයෙක් වීම.

*(උ) විගණකාධිපතිවරයා:*

(i) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා සිටින (ආර්ථික විද්‍යාව, නීතිය හෝ ගණිතය විෂයයන්ට අදාලව නම් වඩාත් යෝග්‍යය),

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනයෙහි (ACA) සාමාජිකයෙකු වන,

(ඇ) රාජ්‍ය අංශයේ විධායක ශ්‍රේණියේ වසර 5ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ඇති,

නියෝජ්‍ය විගණකාධිපතිවරයෙකු වීම

(ii) විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අවම වශයෙන් වසර 25ක සේවා කාලයක් සහිත නියෝජ්‍ය විගණකාධිපතිවරයෙකු

(iii) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා ඇති තැනැත්තෙකු (ආර්ථික විද්‍යාව, නීතිය හෝ ගණිතය විෂයයන්ට අදාළව නම් වඩාත් යෝග්‍යය)

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනයෙහි (ACA) සාමාජිකයෙකු වන

(ඇ) සුදුසුකම් අත්කර ගැනීමෙන් පසු ගිණුම්කරණය, විගණනය, මූල්‍ය පාලනය හෝ අධීක්ෂණය යන ක්ෂේත්‍රයක විධායක ශ්‍රේණියේ තනතුරක වසර 15ක පළපුරුද්ද තිබීම (ඉන් අවම වශයෙන් වසර 10ක පළපුරුද්ද රාජ්‍ය අංශයේ විය යුතුය.)

*(ඌ) පොලිස්පතිවරයා:*

(i) පොලිස් බලකායෙහි අඛණ්ඩ සේවය තිබෙන,

(ii) ගැසට් කරන ලද තනතුරක ක්‍රියාන්විත ප්‍රදේශ රාජකාරිවල වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබෙන (පොලිස් කොට්ඨාශයක් භාර නිලධාරියෙකු ලෙස වසරකට නොඅඩු කාලයක් සේවය කිරීමේ සේවා කාලපරිච්ඡේද අවම වශයෙන් දෙකක්වත් එයට ඇතුළත් විය යුතුය)

(iii) විශේෂ රාජකාරි අංශ එකක් හෝ එකකට වැඩි සංඛ්‍යාවකට අයත් ගැසට් පත්‍රයෙහි පළ කරන ලද තනතුරක වසර 05ක සේවා කාලයක් සපුරා තිබෙන (උදා: අපරාධ විමර්ශන කොට්ඨාසය, ක්ෂේත්‍ර බලකා මූලස්ථානය, සැපයුම් හා සේවා මූලස්ථාන පරිපාලනය)

(iv) දිශා භාර නියෝජ්‍ය පොලිස්පතිවරයකු ලෙස වසරකට නොඅඩු සේවා කාලයක් ද ඇතුළුව නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සපුරා තිබෙන.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ( සාමාන්‍යයෙන් ජ්‍යෙෂ්ඨතම තැනැත්තා) වීම

බුද්ධි අංශ ක්ෂේත්‍රය තුළ ගැසට්ගත කරන ලද තනතුරක සේවා කාලයක් සපුරා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

***(එ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්වරයා):***

(i) ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයකු

(ii) (අ) නීතිඥවරයකු ලෙස වසර 20ක සේවා කාලයක්; සහ

(ආ) 1. මූලික අයිතිවාසිකම්; සහ
2. ස්වාභාවික යුක්තිය පිළිබඳ පරිපාලන නීතිය

යන විෂයයන් පිළිබඳ නෛතික හා කාර්ය පටිපාටිමය දැනුම හා අත්දැකීම් සහිත තැනැත්තකු වීම.

(iii) (අ) පොදු සමාජය තුළ පිළිගත් තනතුරක් දරා ඇති; සහ

(ආ) රජයේ නිලධාරින් සහ රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන හා එවැනි වෙනත් ආයතනවල නිලධාරින් විසින් සිදු කරනු ලබන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හා වෙනත් අසාධාරණ ක්‍රියා පිළිබඳ දැනුමක් හා අත්දැකීම් සහිත තැනැත්තකු වීම

***(ඒ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා:***

(i) පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්වරයා

(ii) පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති තැනැත්තෙකු විය යුතුය

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් (නීතිය සම්බන්ධයෙන් නම් වඩාත් සුදුසු වේ) ලබා තිබීම; සහ

(ආ) නීතිඥවරයෙකු ලෙස වසර 25ක පළපුරුද්දක් ලබා තිබීම

(ඇ) 1. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග
2. ශ්‍රී ලංකාව නිදහස ලබා ගත් දින සිට පැවති ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ
3. පාර්ලිමේන්තු ලේකම් කාර්යාලයෙහි සහ එහි ශාඛාවන්හි සංයුතිය පිළිබඳව

සමීප දැනුමක් ලබා තිබීම

(ඇ) 1. ශ්‍රී ලංකාව නිදහස ලබා ගත් දින සිට ක්‍රියාත්මක වන මැතිවරණ නීති,
2. පොදු රාජ්‍ය මණ්ඩලයේ සහ අනෙකුත් ව්‍යවස්ථා සම්පාදක ආයතනවල ක්‍රියාපටිපාටීන්,
3. රජයේ දෙපාර්තමේන්තු සහ ආයතනවල පරිපාලනයට අදාළ රාජ්‍ය පරිපාලන, මූල්‍ය රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛන පිළිබඳ

ප්‍රයෝගික දැනුමක් තිබීම; සහ

(ඉ) විශේෂයෙන්ම පහත සඳහන් කාර්යයන් පිළිබඳව හැකියාවක් තිබීම:

1. පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සහ කාරක සභා අවස්ථාවේ සංශෝධනවලට අදාළ නීති ඇතුළුව නීති කෙටුම්පත් සම්පාදන කාර්යයට සහාය වීම.

2. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ විශේෂ කාරක සභා ඇතුළු විශේෂ කාරක සභාවල ලේකම්වරයා ලෙස කටයුතු කිරීම.

**9.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 41ඇ(1) ව්‍යවස්ථාව යටතේ නිශ්චිතව දක්වා ඇති තනතුරු සඳහා ජනාධිපතිවරයා විසින් පුද්ගලයන්ගේ නම් නිර්දේශ කිරීමේදී එකී සියලුම නම් කරනු ලබන පුද්ගලයන්ගේ ජීව දත්ත තොරතුරු සභාවෙහි දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලෙස ජනාධිපති ලේකම්වරයාට දැනුම් දීමට ද තීරණය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙහි වැඩබලන මහ ලේකම්වරයා විසින් සභාවේ තීරණය ජනාධිපති ලේකම්වරයා වෙත දැනුම් දෙන ලදී.

**සමාලෝචිත කාලය තුළදී සභාව විසින් සිදු කරන ලද නිර්දේශ හා අනුමැතිය ලබා දීම්**

**(අ) කොමිෂන් සභා:**

පහත සඳහන් පත් කිරීම් සඳහා සභාව විසින් නිර්දේශ ලබා දෙන ලදී

(i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව:
ටයිටස් බෝධිපාල වීරසූරිය මහතා (සභාපති)
ඩබ්ලිව්. ලාල් රංජිත් සිල්වා මහතා
චන්ද්‍රනාත් නෙවිල් ගුරුගේ මහතා

(ii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව:
ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය(සභාපතිනි)
සාලිය කිත්සිරි මාර්ක් පීරිස් මහතා
හමීඩ් ගසාලි හුසේන් මහතා
අම්බිකා සත්කුනනාතන් මහත්මිය
උපනන්ද විදානපතිරණ මහතා

(iii) ජාතික පොලිස් කොමිෂන් සභාව:
මහාචාර්ය එස්.ටී. හෙට්ටිගේ මහතා (සභාපති)
පී.එච්. මනතුංග මහතා
සාවිත්‍රි දර්ශිනී විජේසේකර මහත්මිය
ඇන්ටන් බෙනඩික්ට් ජෙයනාතන් මහතා
වයි.එල්.එම්. සවාහිර් මහතා
දොන් තිලක් පද්මනාභ කොල්lුරේ මහතා
ට්‍රෙවෝර් පර්සිවල් ෆ්‍රැන්ක් ද සිල්වා මහතා

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාව:
ධර්මසේන දිසානායක මහතා (සභාපති)
අබ්දුල් සලාම් අබ්දුල් වයිඩ් මහතා
ධරණී විජයතිලක මහත්මිය
ප්‍රතාප් රාමනුජම් මහතා
විජෙයලක්ෂ්මි ජෙගරාසසිංහම් මහත්මිය
සාන්ති නිහාල් සෙනවිරත්න මහතා
සුගතදාස රනුග්ගේ මහතා

ඩී.එල්. මෙන්ඩිස් මහතා
එස්.ඒ.සී. සරත් විජේවර්ධන ජයතිලක මහතා

(v) මැතිවරණ කොමිෂන් සභාව:
වඩුගේ වරුණසිරි මහින්ද දේශප්‍රිය මහතා (සභාපති)
නලින් ජයන්ත අබේසේකර මහතා
සැමුවෙල් රත්නජීවන් හූල් මහතා

(vi) සීමා නිර්ණය කොමිෂන් සභාව
තාවලිංගම් කනගරත්නම් මහතා (සභාපති)
ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක මහත්මිය
මහාචාර්ය ෂාහුල් හමීඩ් හස්බුල්ලා මහතා

(vii) මුදල් කොමිෂන් සභාව
උදිත හරිලාල් පලිහක්කාර මහතා (සභාපති)
වේලුපිල්ලේ කනගසබාපති මහතා
ආචාර්ය හරීඩ් මොහොමඩ් සෆ්රුල්ලා මහතා
අර්ජුන මහේන්ද්‍රන් මහතා - මහ බැංකු අධිපති - නිල බලයෙන් පත්වූ සාමාජික
ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතා, භාණ්ඩාගාර ලේකම්, නිල බලයෙන් පත් වූ සාමාජික

(viii) විගණන සේවා කොමිෂන් සභාව:
එච්.එම්. ගාමිණී විජේසිංහ මහතා - විගණකාධිපති - නිල බලයෙන් පත් වූ (සභාපති)
නිහාල් සුනිල් රාජපක්ෂ මහතා
ඉලංගකෝන්ගේ ගාමිණී අබේරත්න මහතා
වේලුපිල්ලේ කන්දසාමි මහතා
වැවල අප්පුහාමිලාගේ සෝමපාල පෙරේරා මහතා

(ix) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව:
බූස්ස බදූගේ නිහාල් ඉන්දුනාත් ප්‍රනාන්දු අබේසුන්දර වික්‍රමසූරිය මහතා (සභාපති)
ඇන්තනි නිහාල් ෆොන්සේකා මහතා
දෝන එන්ෆීඩා රංගනී චිත්‍රලතා වෙඩික්කාර මහත්මිය
පුලුක්කුට්ටි ආරච්චිගේ දොන් ක්‍රිස්ටි රේමන්ඩ් පෙරේරා මහතා
මේයන් වාමදේවන් මහතා

**(ආ) අභියාචනාධිකරණ විනිසුරුවරයෙකු පත් කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(1) සහ 41ඇ(1) ව්‍යවස්ථාවන්ට අනුකූලව, මහාධිකරණ විනිසුරු ශ්‍රියානි ද ලිවේරා තෙන්නකෝන් මහත්මිය අභියාචනාධිකරණ විනිසුරුවරයෙකු වශයෙන් පත් කිරීමට ජනාධිපතිතුමන් විසින් සිදුකරන ලද නිර්දේශය සභාව විසින් අනුමත කරන ලදී.

**(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු පත් කිරීම:**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(1) සහ 41ඇ(1) ව්‍යවස්ථාවන්ට අනුකූලව, අභියාචනාධිකරණ විනිසුරු කේ.ටී. චිත්‍රසිරි මහතා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු

වශයෙන් පත් කිරීමට ජනාධිපතිතුමන් විසින් සිදු කරන ලද නිර්දේශය සභාව විසින් අනුමත කරන ලදී.

**(ඈ) විගණකාධිපතිවරයා පත්කිරීම:**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) සහ 41ඇ(1) ව්‍යවස්ථාවන්ට අනුකූලව, එච්.එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත් කිරීමට ජනාධිපතිතුමන් විසින් සිදු කරන ලද නිර්දේශය සභාව විසින් අනුමත කරන ලදී.

-----------

## <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41උ(1) ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වාර්තාව</u>

2015 දෙසැම්බර් සිට 2016 පෙබරවාරි දක්වා කාලය සඳහා ඉදිරිපත් කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ දෙවන වාර්තාව

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ රැස්වීම්:**

2015 දෙසැම්බර් 04 වන දින, 2015 දෙසැම්බර් 22 වන දින, 2016 ජනවාරි 06 වන දින, 2016 ජනවාරි 09 වන දින, 2016 ජනවාරි 25 වන දින, 2016 පෙබරවාරි 08 වන දින, 2016 පෙබරවාරි 10 වන දින, 2016 පෙබරවාරි 19 වන දින, 2016 පෙබරවාරි 26 වන දින යන දිනයන්හිදී සභාව රැස්විය.

**සලකා බැලෙන කාලසීමාව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ(1) ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සිදුකළ නිර්දේශ සඳහා අනුමැතිය ලබාදීම:**

*(1) අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙකු පත් කිරීම:*

2016 ජනවාරි 06 වන දින රැස්වූ සභාව, මහාධිකරණ විනිසුරුවරයකු වන පී.පී. සූරසේන මහතා අභියාචනාධිකරණ විනිසුරුවරයකු වශයෙන් පත් කිරීම පිණිස අතිගරු ජනාධිපතිතුමා විසින් සිදුකර තිබූ නාමයෝජනාව අනුමත කරන ලදී.

*(2) වැඩබලන නීතිපතිවරයා පත්කිරීම සඳහා අනුමැතිය ලබාදීම:*

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ(2) ව්‍යවස්ථාව ප්‍රකාරව නීතිපති තනතුර සඳහා ජනාධිපති නීතිඥ සුහද කළ්‍යාන ගම්ලත් සොලිසිටර් ජෙනරාල්වරයා වෙත වැඩබලන පදනමෙන් ලබාදී ඇති පත්වීමේ කාලය දීර්ඝ කිරීම පිණිස ජනාධිපතිවරයා විසින් සිදුකර තිබූ නිර්දේශය 2016 ජනවාරි 25 වන දින සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

*(3) නීතිපතිවරයා පත්කිරීම:*

ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ ජයන්ත චන්ද්‍රසිරි ජයසූරිය මහතා නීතිපති තනතුරට පත්කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ නාමයෝජනාව අනුමත කිරීමට සභාව විසින් 2016 පෙබරවාරි 10 වන දින තීරණය කරන ලදී.

*(4) ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු පත් කිරීම:*

අභියාචනාධිකරණ විනිසුරුවරයකු වන ගරු එච්.එන්.ජේ. පෙරේරා විනිසුරුතුමා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු වශයෙන් පත් කිරීම පිණිස අතිගරු ජනාධිපතිතුමා විසින් සිදුකර තිබූ නාමයෝජනාව අනුමත කිරීමට සභාව විසින් 2016 පෙබරවාරි 26 වන දින තීරණය කරන ලදී.

**සභාව විසින් ගනු ලැබූ අනෙකුත් තීරණ:**

(1) කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වය ඇගැයීම පිණිස කොමිෂන් සභා සභාපතිවරුන් සහ සාමාජිකයින් කලින් කලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සමග රැස්වීම් පැවැත්විය යුතු බවත්, ඒ සම්බන්ධයෙන් යම් නීතියක් තිබේ නම්, එකී නීතියෙන් නියම කර ඇති පරිදි හෝ ත්‍රෛමාසිකව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හරහා පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට කොමිෂන් සභා කටයුතු කළයුතු බවත් සභාව විසින් තීරණය කරන ලදී. ඒ අනුව, ස්වකීය කොමිෂන් සභා සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීම පිණිස විගණන සේවා කොමිෂන් සභාවේ සහ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරුන් හා සාමාජිකයින් 2015 දෙසැම්බර් 04 වන දින සභාව සමගින් රැස්වීම්

පවත්වන ලදි.2016 ජනවාරි 09 වන දින සීමා නිර්ණය කොමිෂන් සභාව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණන සේවා කොමිෂන් සභාව සහ මැතිවරණ කොමිෂන් සභාව යන කොමිෂන් සභාවල සභාපතිවරුන් සමගින් භාණ්ඩාගාරයෙන් මුදල් වෙන්කිරීම, කාර්යමණ්ඩල අවශ්‍යතා සහ කාර්යාලීය ඉඩකඩ අවශ්‍යතා යනාදී ගැටළු පිළිබඳව කරුණු සාකච්ඡා කිරීමට සභාව විසින් කටයුතු කරන ලදී.

(2) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා සිදුකළ ඉල්ලීමක් ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ කාරක සභා කාමරවල ඔවුන්ගේ රැස්වීම් පැවැත්වීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා අනුමැතිය ලබාදුන්නේ ය.

(3) මැතිවරණ කොමසාරිස් ජෙනරාල්වරයාගේ තනතුරු නාමය වෙනස්වීම හා මැතිවරණ කොමසාරිස් ජෙනරාල්වරයාගේ විශ්‍රාම වයස අඩුකිරීම සහ කොමිෂන් සභාවල සභාපතිවරුන් හා සාමාජිකයින් වෙනුවෙන් යෝජිත වේතන හා දීමනා සම්බන්ධයෙන් වන අමාත්‍ය මණ්ඩල සන්දේශය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කිරීම පිණිස, ගරු අග්‍රාමාත්‍යවරයාගේ ලේකම් වෙත යැවීමට සභාව විසින් තීරණය කරන ලදී. මැතිවරණ කොමිෂන් සභාව සඳහා වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාව 2015.12.16 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති බව 2015.12.24 දාතම සහිතව අමාත්‍ය මණ්ඩල ලේකම් විසින් එවන ලද ලිපියෙන් දැනුම් දී තිබේ.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාවේ උපලේඛනයෙහි සඳහන් කර ඇති තනතුරු සඳහා පත්කිරීම් සිදුකිරීම සම්බන්ධයෙන් අළුතින් නිර්ණායක මාලාවක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සභාවේ සාකච්ඡාවට ලක් විය.එකී නීති සම්පාදනයේදී පක්ෂ නායකයින්ගේ අදහස් ලබාගැනීමට කටයුතු කළයුතු බව සභාවේ අදහස විය. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වන සංශෝධනය යටතේ ස්ථාපිත කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිගත් නිර්ණායකයන්හි පිටපත්, පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳ කාරක සභාවේ සාමාජිකයින්ගේ අදහස් ලබාගැනීම සඳහා ඔවුන් වෙත යවන ලදී.

(5) ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් සහ ජනාධිපති නීතිඥවරුන් වශයෙන් පුද්ගලයින් පත් කිරීමට නිර්දේශ ලබාදීමේදී අතිගරු ජනාධිපතිතුමාට අදහස් විමසිය හැකි අග්‍රවිනිශ්වයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ වඩාත්ම ජ්‍යෙෂ්ඨ විනිශ්වයකාරවරුන්, නීතිපතිවරයා සහ වඩාත්ම ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන්ගෙන් සමන්විත උපදේශක කමිටුවක් ස්ථාපිත කිරීමේ යෝජනාවට සභාවේ අනුමැතිය ලබා දුනි.

(6) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති දීමනා පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය කොමසාරිස්වරුන්ට දැනටමත් ලැබෙන ඇතැම් පහසුකම් හා වරප්‍රසාදවලට සමගාමීව සංශෝධනය කිරීමට කටයුතු කරන මෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සිදුකළ ඉල්ලීම සලකා බැලීමට සභාව විසින් තීරණය කරන ලදී.

---------

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ද(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වාර්තාව

*2016 මාර්තු මාසයේ සිට 2016 මැයි මාසය දක්වා කාල පරිච්ඡේදය සඳහා වන ව්‍යවස්ථාදායක සභාවෙහි තුන් වන වාර්තාව*

**ව්‍යවස්ථාදායක සභාවෙහි රැස්වීම්:**

2016 මාර්තු 16, 2016 අප්‍රේල් 18, 2016 අප්‍රේල් 28, 2016 මැයි 31 සහ 2016 ජූනි 10 යන දින වලදී සභාව රැස්වෙන ලදී.

**සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 41ඇ(1) ව්‍යවස්ථාව අනුව අතිගරු ජනාධිපතිතුමාගේ නිර්දේශ සඳහා අනුමැතිය ලබා දීම:**

1. *අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙකු පත් කිරීම:*

   ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 107(1) ව්‍යවස්ථාව සහ 41ඇ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව මහාධිකරණ විනිසුරු එල්.යූ. ජයසූරිය මහතා අභියාචනාධිකරණ විනිසුරුවරයෙකු ලෙස පත්කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ නාම යෝජනාව 2016 මාර්තු මස 16 වැනි දින රැස්වූ සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

2. *පොලිස්පතිවරයා පත් කිරීම:*

   ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 61ඉ(1)(ආ) ව්‍යවස්ථාව සහ 41ඇ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පොලිස්පති තනතුර සඳහා පත්කරනු ලැබීමට අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ නාම යෝජනා තුන සළකා බැලූ සභාව, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පී.එස්.බී. ජයසුන්දර මහතා පොලිස්පති තනතුරට පත්කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ නාම යෝජනාව 2016 මාර්තු මස 18 වැනි දින පැවති එහි රැස්වීමේ දී අනුමත කරන ලදී.

3. *අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා සාමාජිකයෙකු පත් කිරීම:*

   ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 111ඇ ව්‍යවස්ථාව සහ 41ඇ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු සිසිර ජේ. ද ආබෲ මහතා අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ නාම යෝජනාව 2016 අප්‍රේල් මස 28 වැනි දින රැස්වූ සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

4. *ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු පත් කිරීම:*

   ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 107(1) ව්‍යවස්ථාව සහ 41ඇ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපති නීතිඥ ප්‍රසන්න සුජීව ජයවර්ධන මහතා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකු ලෙස පත්කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ නාම යෝජනාව 2016 ජූනි මස 10 වැනි දින රැස්වූ සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

**41උ(2) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම සභාව විසින් ඉටු කරන ලද වෙනත් කාර්යයන්:**

1. 2002 අංක 24 දරණ සුභසාධන ප්‍රතිලාභ පනතෙහි විධිවිධාන ප්‍රකාරව, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයෙහි මණ්ඩල සාමාජිකයින් පත්කිරීමේදී අනුගමනය කිරීම සඳහා ගරු මුදල් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලද නිර්ණායක මෙම සභාව විසින් අනුමත කරන ලදී.

**මෙම සභාව විසින් ගනු ලැබූ වෙනත් තීරණ:**

1. ස්වාධීන කොමිෂන් සභාවල සාමාජිකයින් විසින් වර්තමානයේ භුක්තිවිඳිනු ලබන ප්‍රතිලාභ සහ පහසුකම්වලට, ස්වාධීන කොමිෂන් සභාවල සභාපතිවරුන්ට සහ සාමාජිකයින්ට ගෙවනු ලබන පඩිනඩි සහ දීමනාවලට අදාළව අමාත්‍ය මණ්ඩල විසින් ගනු ලබන තීරණ මගින් බලපෑමක් ඇති නොවිය යුතු බවට සභාව විසින් තීරණය කරන ලදී.

2. මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු විදේශ නිවාඩු ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් කරන ලද විමසීමකට අනුව, ස්වාධීන කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයින් විසින් ඉදිරිපත් කරනු ලබන විදේශ නිවාඩු ඉල්ලීම් ව්‍යවස්ථාදායක සභාව වෙනුවෙන් අනුමත කිරීමේ බලතල ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සභාවේ සභාපතිවරයාට පැවරීමට සභාව විසින් යෝජනා සම්මත කරන ලදී. මෙම තීරණය ස්වාධීන කොමිෂන් සභා නවයෙහි ලේකම්වරුන් වෙත දැනුම් දෙන ලදී.

3. අග්‍රවිනිශ්චයකාරවරයා, අභියාචනාධිකරණයේ සභාපතිවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ අනෙකුත් විනිශ්චයකාරවරුන් සහ නීතිපතිවරයා පත් කිරීමට අදාළ නිර්ණායක සහ කාර්ය පටිපාටිය පිළිබඳව ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසීස් මහතා විසින් සකස් කරන ලද සටහන පිළිබඳ සභාව විසින් අතිගරු ජනාධිපතිතුමාට දැනුම් දෙන ලදී.

4. සභාව විසින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම පිණිස සභාව විසින් මාධ්‍ය නිවේදනයක් නිකුත් කරන ලදී.

-----------

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 41උ(1) ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වාර්තාව**

*2016 ජූලි මස සිට 2016 සැප්තැම්බර් මස දක්වා කාල පරිච්ඡේදය සඳහා වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙහි හතරවැනි වාර්තාව*

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙහි රැස්වීම්:**

2016 ජූලි 07, 2016 අගොස්තු 12, 2016 අගෝස්තු 25, 2016 සැප්තැම්බර් 08 යන දිනවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස්වීම් පවත්වනු ලැබීය.

**සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ අතිගරු ජනාධිපතිතුමාගේ නිර්දේශ සඳහා අනුමැතිය ලබාදීම සහ අතිගරු ජනාධිපතිතුමා වෙත සභාව විසින් කළ නිර්දේශ:**

1. *අභියාචනාධිකරණය සඳහා විනිශ්චයකාරවරයකු පත් කිරීම:*

   ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 107(1) ව්‍යවස්ථාව සහ 41ඇ(1) ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් අතිරේක සොලිස්ටර් ජෙනරාල් එස්. තුරෙයිරාජා මහතා, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන් පත් කිරීමට කළ නාම යෝජනාව 2016 සැප්තැම්බර් මස 08 වන දා රැස් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදි.

2. *ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ පුරප්පාඩු තනතුර සඳහා පත් කිරීම:*

   අවසන් වශයෙන් කෙටි ලැයිස්තුගත කළ අපේක්ෂකයන් අතුරින් ඉතිරි අපේක්ෂකයන් සලකා බැලීමෙන් අනතුරුව, සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයෙන් සහ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයෙන්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ පුරප්පාඩු තනතුර සඳහා නව නාම යෝජනා කැඳවීමට සභාව විසින් තීරණය කරන ලදි.

   ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 41ආ(3) ව්‍යවස්ථාව අනුව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවෙහි සාමාජිකයකු ලෙස දොන් නොයෙල් ලක්ෂ්මන් වික්‍රමසිංහ මහතා පත් කිරීම සඳහා නාම යෝජනා කිරීමට සභාව ඒකමතිකව නිර්දේශ කරන ලදි.

**41උ(2) ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සිදු කරන ලද වෙනත් කාර්යයන්.**

1. 2016 ජූලි මස 07 වැනි දා රැස් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීමේදී, 2002 අංක 32 දරණ මුදල් නීති (සංශෝධන) පනතින් සංශෝධනය වූ මුදල් නීති 323 පරිච්ඡේදයෙහි විධිවිධානයන්ට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙහි සාමාජිකයකු ලෙස ඇන්තනී නිහාල් ෆොන්සේකා මහතා පත් කිරීමට අතිගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නාමයෝජනාව ඒකමතිකව අනුමත කරන ලදි.

2. 2016 ජූලි 07 වැනි දා රැස් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් 2002 අංක 24 දරණ සුභසාධක ප්‍රතිලාභ පනතෙහි 4 වන වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතෙහි 2 වන වගන්තියට අනුව සුභසාධක ප්‍රතිලාභ

මණ්ඩලයෙහි මණ්ඩල සාමාජිකයන් පත්කිරීම පිණිස මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් නාමයෝජනාවන් ඒකමතිකව අනුමත කරන ලදි:

1. මණ්ඩලයෙහි සභාපතිවරයා ලෙස සුගතදාස රනුග්ගේ මහතා
2. මණ්ඩලයෙහි සාමාජිකයෙකු ලෙස ගාමිණී සරත් එදිරිසිංහ මහතා
3. මණ්ඩලයෙහි සාමාජිකයෙකු ලෙස ඒ.ආර්. දේශප්‍රිය මහතා
4. මණ්ඩලයෙහි සාමාජිකයෙකු ලෙස සුනිල් ශාන්ත හෙට්ටිආරච්චි මහතා
5. මණ්ඩලයෙහි සාමාජිකයෙකු ලෙස තිස්ස නානායක්කාර මහතා

3. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට සිදු කරන පත් කිරීම්:

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීම පිණිස සංවිධානයන්ගෙන් සහ වෘත්තීය ආයතනයන්ගෙන් නාමයෝජනා කැඳවමින් පුවත්පත් දැන්වීමක් පළ කළ අතර, අයදුම්පත් 40ක් ලැබුණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙහි සිවිල් සමාජ සාමාජිකයන් තිදෙනා විසින් මූලිකව ඇගයීමට ලක් කරන ලද අයදුම්පත්වලින් අයදුම්පත් 15ක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින් කෙටි ලැයිස්තු ගත කරන ලදි.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධානයන්ට අනුකූලව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව සඳහා, 2016 අගෝස්තු මස 25 වැනිදා පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභා රැස්වීමේදී පහත පුද්ගලයන් ඒකමතිකව නිර්දේශ කරන ලදි:

1. විනිසුරු සලීම් මර්සූෆ් (නීති ක්ෂේත්‍රයෙහි නියෝජනය වශයෙන්)
2. කිෂාලි පින්ටෝ ජයවර්ධන මෙනවිය (ප්‍රකාශක, කතෘ සහ මාධ්‍යවේදී ක්ෂේත්‍රයන්හි නියෝජනය වශයෙන්)
3. නාගනාදන් සෙල්වකුමාරන් මහතා ( සිවිල් සමාජ සංවිධාන නියෝජනය සඳහා)
4. දොන් මහින්ද ගම්මම්පිල මහතා
5. එස්.ජී. පුංචිහේවා මහතා

(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින් නාම යෝජනා කෙරෙන අනෙකුත් සාමාජිකයන් දෙදෙනා ලෙස)

***ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ගත් අනෙකුත් තීරණ:***

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට එරෙහිව ගොනු කළ මූලික අයිතිවාසිකම් අයදුම්පතක් පිළිබඳව නීතිපතිවරයාගේ මතය සභාව විසින් විමසන ලදුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් බලය ලබා දී ඇති පරිදි සභාවෙහි කාර්යයන්හි නිරතවීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නව රීති මාලාවක් සැකසීම අනිවාර්යය අවශ්‍යතාවයක් නොවන බව දක්වා ඇති අතර, රීති මාලාවකට අනුගතව ක්‍රියා කරනවාටත් වඩා 41ආ ව්‍යවස්ථාව යටතේ හෝ 41ඇ ව්‍යවස්ථාව යටතේ යම් කිසි පුද්ගලයකු යම් තනතුරකට පත්

කිරීමේදී හෝ නිර්දේශ කිරීමේදී යම් කිසි මාර්ගෝපදේශ මාලාවකට එකඟව කටයුතු කළයුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් තීරණය කරන ලදි.

- 41ඇ ව්‍යවස්ථාවේ උප ලේඛනයෙහි විශේෂිතව දක්වා ඇති යම් තනතුරක වැඩබැලීම සඳහා පුද්ගලයින් පත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙනුවෙන් අනුමැතිය ලබාදීමේ බලය ගරු කථානායකවරයා වෙත ප්‍රදානය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තීරණය කරන ලද අතර, ඉන් අනතුරුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින් ආවරණ අනුමැතිය ලබා දීමටද තීරණය කරන ලදි.

-------------------